ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 11 | විෂයය Subject: සිංහල භාෂාව හා සාහිත්‍ය - II | කාලය Time: පැය 02 |

නම : ..............................................................................................................................................

**සැලකිය යුතුයි :**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර <u>නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.</u>

i සිංහල අක්ෂරමාලාවේ ඇතුළත්

(අ) සංයුක්ත ( මිශ්‍ර ) ස්වරයක්

(ආ) අර්ධ ස්වරයක් ලියා දක්වන්න.

ii පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද <u>දෙකක්</u> ලියන්න.

වකුටු පිහිය අතට ගත් කැහැටු මිනිසා ඉතාමත් ඉක්මනින් ගෙදර ගියේ ය.

iii පහත සඳහන් පද විසන්ධි කරන්න.

(අ) රුවනාර (ආ) ලම්බෝදර

iv පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන <u>දෙක</u> පමණක් නිදොස් කර ලියන්න.

නර්ථන කුශලතා වර්ධනය කරගත් සිසුන් විසින් තම ප්‍රථම සන්දර්ශනය ඉදිරිපත් කරන ලදී.

v පහත සඳහන් අනුක්ත පදවල උක්ත රූප ලියා දක්වන්න.

(අ) ගුරුවරියක (ආ) වාර්තාකරුවකු

vi පහත සඳහන් පදවලට විරුද්ධාර්ථාවත් පදය බැගින් ලියන්න.

(අ) අනපේක්ෂිත (ආ) සංකෝචනය

vii පහත සඳහන් වාක්‍යයේ අන්තර්ගත වන නිපාත පද දෙකක් ලියා දක්වන්න.

ඊයේ රෝගියකු ලෙස රෝහලට පැමිණි ඔහු අද නිරෝගී ව නිවසට පැමිණියේ ය.

viii පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) රජතුමා සපිරිවරෙන් මාළිගයට පිවිසෙති.

(ආ) දැඩි උෂ්ණත්වය නිසා සතුන් පවා පීඩාවට පත් වෙති.

ix පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත්වන විභක්තිය නම් කරන්න.

(අ) ඉඩෝරයට වැව් දිය සිඳී යයි.

(ආ) පොකුණෙහි නෙළුම් පිපේ.

x පහත සඳහන් වාක්‍ය කර්මාකාරකයට හරවා ලියන්න.

(අ) ඉංජිනේරුවෝ ගංගාවන් හරවති.

(ආ) ආත්මාර්ථකාමීහු වන සම්පත් විනාශ කරති. ( ල. 20 )

(2) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) නූතනයේ සන්නිවේදන තාක්ෂණය විවිධ ක්‍රම ඔස්සේ ව්‍යාප්තව ඇත. තත්පර ගණනක් තුළ ලක්ෂ සංඛ්‍යාත පිරිසකට ඕනෑම දෙයක් සන්නිවේදනය කිරීම දක්වා එය තීව්‍ර වී ඇත. එහෙත් වර්තමානයේ සන්නිවේදන තාක්ෂණය අවභාවිතා කරනු දක්නට ලැබේ. දිනපතා එතුළින් අපහසුතාවයට පත් වූවන්, ජීවිත හානි කරගත් අයවලුන් පිළිබඳ අසන්නට ලැබේ. නූතන තාක්ෂණය හරහා ලෝකය සැමට විවෘත ව ඇත. එය විධිමත් ව පත්වා ගැනීමට නම් විධිමත් නියාමනයකට යටත් කළ යුතු ය.

(ආ) ශ්‍රී ලංකාව දැකුම්කලු එමෙන් ම ස්වභාව සෞන්දර්යයෙන් අනූන රටකි. උණුසුම, සිසිල අතර සම ගුණය සහිත ශ්‍රී ලංකාව, විදේශිකයන්ගේ නොම ද අවධානයට යොමු වන්නේ එම දේශගුණික තත්ත්වය ද හේතුවෙනි. එය සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට හේතු වී ඇත. සංචාරක කර්මාන්තයෙහි දියුණුව රටෙහි සංවර්ධනයට හේතු වෙයි.

(ඉ) මිනිස් හදවත් ප්‍රබලව ආමන්ත්‍රණය කළ හැකි කලා මාධ්‍යයක් ලෙස ගීතය හැඳින්විය හැකිය. නූතනයේ ආසන්නට ලැබෙන බොහෝ ගීත නිර්මාණ පහත් රසය පමණක් මුල්කරගත් හර සුන් නිර්මාණ බව විචාරක මතයයි. පුද්ගල දිවියට අහිතකර බලපෑම් ඇති කිරීමට සමත් ප්‍රබල කලා මාධ්‍යයක් වන ගීතය රසිකයාට රසයත් හරයත් ලබාදෙන කලා මාධ්‍යයක් ලෙස සකස් විය යුතුය.

(ඊ) සමාජ සංවර්ධනයේ දී ප්‍රධානතම දායකත්වය සපයන්නේ සාහිත්‍ය යි. තර්කය හා විද්‍යාව මත පදනම් වූ ලෝකය ඉදිරියට යනමුත් මානසික සංවර්ධනයට අවශ්‍ය

ප්‍රගතිගාමී අදහස් ජනිත නොවේ. හෙට ලෝකයට මුහුණ දෙන නූතන පරපුර සාහිත්‍ය හැදෑරීමෙන් වෙන් වී තර්කය, විද්‍යාව යන විෂය ක්ෂේත්‍රවල නියැලෙන බව දැකිය හැකිය. එමගින් කලාව මනුෂ්‍යා තුළින් තුරන් වී යාමට ඇති ඉඩ ප්‍රස්තාව ඉතා අධික ය. මනසින් උසස් මනුෂ්‍යයෙකු නිර්මාණය වන්නේ තර්කයෙන් ම පමණක් නොව සාහිත්‍ය ද ඊට මහගු පිටු බලයක් වෙයි. වර්තමානයේ අපරාධ වැඩි වීමට ප්‍රබල හේතුවක් වී ඇත්තේ ද පුද්ගලයා තුළ සාහිත්‍යයට ඇති අල්ප නැඹුරුවයි. (ල.25)

(3) පහත දැක්වෙන පාඨය වචන 50-60 අතර වන සේ සාරාංශ කොට ලියන්න.

ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අධ්‍යයන කාර්යයෙහි හා දරුවන් හදාවඩා ගැනීමේ කාර්යයේ නියුක්ත සැවොම මෙම පරිණත ක්‍රියාවලිය නිවැරදිව වටහා ගත යුතු ය. ඇඟිලිවල මාංශපේශී නිසි අන්දමට වැඩෙන්නට පෙර අකුරු ලියවීම, ඇස්වල මාංශපේශී නිසි ලෙස වැඩෙන්නට පෙර අකුරු කියවීමට තැත් කිරීම, කකුල් හරි හැටි ශක්තිමත් වීමට පෙර ඇවිදින්නට තැත් කිරීමට යන මේ සියල්ල ස්වභාවික පරිණතිය හා සංවර්ධන රටාව නොදැන කරන අනුවණකමය. මේ නිසා දෙමව්පියන්, ළදරු පාසල් ගුරුවරියන් හා ප්‍රාථමික පාසල් ගුරුවරියන් විශේෂයෙන් ම දරුවන්ගේ පරිණතිය තේරුම්ගෙන තම ඉගැන්වීමේ කාර්යය සැලසුම් කළ යුතු වේ.

දරුවා ඇල්ලීමට, ලිවීමට, කියවීමට පෙර කායිකව පරිණත වී නැත්නම් මානසික සූදානමක් ඇති නොවේ. එය අනවශ්‍ය ලෙස බලෙන් ඇති කිරීම අවශ්‍ය නැත. අවශ්‍ය පරිසරය ළඟා කළ විට, පහසුකම් සැලැස්සූවිට, වයසෙන් වැඩෙන් ම දරුවා පරිසරය සමග අන්තර් ක්‍රියාකාරකම් කරමින් පරිණතියට අනුකූලව බුද්ධි වර්ධනය කරගනු ඇත. මේ නිසා ළදරුවන්ට ඉගැන්වීමට උත්සාහ කරනු වෙනුවට ක්‍රියාකාරකම් කිරීමට ක්‍රීඩා කිරීමට උචිත යහපත් ප්‍රසන්න පරිසරයක් සපයා දීම වඩාත් බුද්ධිගෝචර වේ. (ල. 10)

(4) පහත දැක්වෙන පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර භාවිතයේ උපරිම කාල සීමාව ක්‍රිස්තු පූර්ව තුන් වන ශතවර්ෂය ලෙස ගණන් ගන්නා අතර අධඃ සීමාව ක්‍රි.ව. හත් වන ශතකය ලෙස සැලකිය හැක. අට වන ශතවර්ෂයේ පටන් පසළොස් වන ශතවර්ෂය තෙක් වූ කාලය වර්තමාන සිංහල අක්ෂර රූප විකාශනයට ගත වූ කාලයයි. ඒ යුගය පශ්චාද් බ්‍රාහ්මී යුගය ලෙස සැලකේ. ක්‍රි.පූ. තුන් වන ශතවර්ෂයේ පටන් ක්‍රි.පූ. පළමු වන ශතවර්ෂයේ පූර්ව භාගය තෙක් පූර්ව බ්‍රාහ්මී යුගය ලෙස ද එතැන් පටන් ක්‍රි.ව. හත් වන ශතවර්ෂය තෙක් අපර බ්‍රාහ්මී යුගය ලෙස ද බෙදා දැක්වීමට තරම් අකුරුවල විශේෂ ලක්ෂණ විද්‍යමාන වේ. පූර්ව බ්‍රාහ්මී යුගයේ ලක්ෂණ මෙසේ හඳුනා ගැනීමට පුළුවන් වේ. ගල් ලෙන්වල කටාරම් රේඛාවට යටින් කොටා තිබෙන වාක්‍ය ඉතා කෙටි ය. කේවල දීර්ඝ ස්වර හෝ ව්‍යඤ්ජනාශ්‍රිත දීර්ඝ ස්වර හෝ දක්නට නො ලැබේ. සංයුක්තාක්ෂර හෝ මහාප්‍රාණාක්ෂර විරල ය. මේ යුගයේ විද්‍යමාන අකුරු එකිනෙක ගෙන සසඳා බැලීමේ දී ඒවා ලංකාවට ආවේණික වූ අක්ෂර, අශෝක අධිරාජ්‍යයේ බටහිර හා දකුණු ප්‍රදේශවල දක්නා අක්ෂර හා මධ්‍යම සහ නැගෙනහිර ඉන්දියානු ප්‍රදේශවල දක්නා අක්ෂර යයි අක්ෂර ගණත්‍රයක ලා ගිණිය හැකි බැව් පෙනේ. එයින් අපට අනුමාන කරන්නට හැකි වී තිබෙන්නේ එකල සම්මිශ්‍රිත බ්‍රාහ්මී හෝඩියක් ලංකාවේ භාවිතා වූ බවකි.

(i) ලංකාවේ අක්ෂර සංවර්ධනයේ අවස්ථා කීයක් මේ ඡේදයෙන් හෙළි වේ ද?

(ii) අක්ෂර භාවිතයේ අධඃ සීමාව යන්නෙන් මේ ලේඛකයා අදහස් කළේ කුමක් ද?

(iii) පූර්ව බ්‍රාහ්මී යුගයේ ලේඛනවල කැපී පෙනෙන විශේෂ ලක්ෂණ කවරේ ද?

(iv) කේවල දීර්ඝාක්ෂර හා සංයුක්තාක්ෂර යනු මොනවා ද?

(v) පූර්ව බ්‍රාහ්මී යුගයේ සම්මිශ්‍රිත බ්‍රාහ්මී හෝඩියක් ලංකාවේ පැවති බව අනුමාන කළ හැකි සාධක දක්වන්න. (ල. 10)

(5) පහත දැක්වෙන තොරතුරු පදනම් කොට ගෙන පුවත්පත් වාර්තාවක් සකස් කරන්න.( වචන 100 ක් පමණ ප්‍රමාණවත්ය )

(02) සාහිත්‍ය මාසය නිමිති කොට ගෙන නෙලුම්දෙණිය මහා විද්‍යාලයෙහි පැවති සාහිත්‍ය උත්සවයට පැමිණි පුවත්පත් වාර්තාකරුවකු සමන් වීරරත්න සතු සටහන් කීපයක් පහත දැක්වේ. එකී සටහන් පාදක කොට ගෙන එකී උත්සවය ගැන පුවතපත් වාර්තාවක් ලියන්න.

- ස්ථානය - නෙලුම්දෙණිය මහා විද්‍යාලයෙහි ප්‍රධාන ශ්‍රවණාගාරය
- දිනය - සැප්තැම්බර් 10
- වේලාව - පෙ. ව. 10. 30
- ප්‍රධාන ආරාධිතයා - සාහිත්‍යවේදී ගුණදාස අමරසේකර
  තරුණ පරපුර විවිධ මානසික පීඩාවන්ට පත් වීමට පාසල් අවධියේ ශිෂ්‍යයන් කලාවෙන් සාහිත්‍යයෙන් ඈත් වීම හේතු වී ඇති බව එතුමා වැඩිදුරටත් පැවසුවා.
- සංවිධානය - නෙලුම්දෙණිය මහා විද්‍යාලයෙහි සියපත සාහිත්‍ය සංගමය
- නෙලුම්දෙණිය කලාප අධ්‍යපන අධ්‍යක්ෂකතුමා, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා, ප්‍රදේශීය ලේකම්තුමා, මව්පියන් සහ විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවෝ බොහෝ පිරිසක් මෙම උලෙළට සහභාගී වුණා.
- ගද්‍ය ,පද්‍ය, නාට්‍ය, කෙටිකතා, නවකතා මෙන් ම ගායන වාදන නර්තන අංශවල ජයග්‍රාහී ශිෂ්‍ය ශිෂ්‍යාවෝ එදින සහතිකපත් හා ත්‍යාග ලබා ගත්තා.
- මෙම උලෙළ අධ්‍යාපනික ප්‍රදර්ශන හා ගායන, නර්තන ඇතුළත් විචිත්‍රවත් විවිධ ප්‍රසංගයකින් ද යුක්ත විය.

නැතහොත්

පාසල් පරිසරයට නොසැලකිලිමත් ලෙස මුදා හරින පොලිතින් වැනි නොදිරන අප ද්‍රව්‍ය නිසා සිදුවන හානිය විශාල ය. මේ පිළිබඳ දැනුවත් කරමින් පාසලේ සහෝදර සහෝදරියන් අතර බෙදාදීම සඳහා අත් පත්‍රිකාවක් සකස් කරන්න. ඔබ පරිසර සංගමයේ ලේකම් කේෂාන් යස්මිත යැයි සිතන්න.